# රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC)

## ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

SPMC ආයතනයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා, සුදුසුකම්ලත්, ක්‍රියාශීලී, ස්වයං උද්‍යෝගී, රැකියා උත්තතිකාමී කණ්ඩායම් සාමාජිකයන් බඳවා ගැනීමට අවශ්‍යව ඇත.

**සෑම අයදුම්කරුවකුම,**

i) ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

ii) තනතුරට අදාල රාජකාරී නිසි අයුරින් ඉටුකිරීමටත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් හැකිවන අයුරු මනා ශාරීරික හා මානසික සුවතාවයෙන් යුක්ත විය යුතුය.

iii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

## 1. තත්ත්ව සහතික කිරීමේ නිලධාරී තනතුර (JM - 1-1 II ශ්‍රේණිය)

**සුදුසුකම් - බාහිර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් රසායන විද්‍යාව හෝ ඖෂධ විද්‍යාව විෂයයක් ඇතුලත්ව විද්‍යා ප්‍රථම උපාධියක්.

2) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

රාජ්‍ය ආයතනයක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක ඖෂධ තත්ත්ව සහතික ක්ෂේත්‍රයේ, සුදුසුකම් ලැබීමෙන් පසු, අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද.

**සටහන :** ඖෂධ පිළිබඳ රසායනාගාර වැඩ හා තත්ත්ව කළමනාකරණ පද්ධති සම්බන්ධව පළපුරුද්දක් සතුවීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් වෙනින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ පළපුරුද්ද සමග "කළමනාකරණ සහකාර - තාක්ෂණ" (MA 2-1) II ශ්‍රේණිය තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවයක් සම්පූර්ණ කොට තිබීම.

## 2. නියාමන කටයුතු නිලධාරී තනතුර (JM-1-1 II ශ්‍රේණිය) (පහත 1, 2 හෝ 3)

**සුදුසුකම් - බාහිර අයදුම්කරුවන් :**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඖෂධ විද්‍යා ප්‍රථම උපාධියක්.

2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, රසායන විද්‍යාව හෝ ඖෂධ විද්‍යාව විෂයයන් ඇතුලත් විද්‍යා ප්‍රථම උපාධියක්

**සහ**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි ඖෂධවේදියකු වීම.

3) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**සහ**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි ඖෂධවේදියෙකු වීම සහ රජයේ ආයතනයක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක, ඖෂධ නියාමන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුන් (පහත1 හෝ 2)**

1) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් වෙනින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

2) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි ඖෂධවේදියකු වීම සහ තනතුරට අදල විෂය ක්ෂේත්‍රයේ පළපුරුද්ද සමග "කළමනාකරණ සහකාර - තාක්ෂණ" (MA 2-1) II ශ්‍රේණිය තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවයක් සම්පූර්ණ කොට තිබීම.

- ❖ **වැටුප් පරිමාණය** : JM 1-1-2016 - රුපියල් 42,600/- 10X755 - 18X1135 - 70,580/-
- ❖ **වයස් සීමාව** : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදල නොවේ.
- ❖ **බඳවා ගැනීමේ ක්‍රමවේදය** : ලිඛිත තරඟකාරී විභාගයෙන් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**ආන්තික ප්‍රතිලාභ**

- ❖ පැමිණීමේ හා කාර්ය සාධන දිරි දීමනා.
- ❖ භාවිතයට නොගත් වාර්ෂික හා අසනීප නිවාඩු සඳහා මුදල් ගෙවීම.
- ❖ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය හා වෛද්‍ය ප්‍රතිපූර්ණ යෝජනා ක්‍රමය.
- ❖ සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයා විසින් 10% ප්‍රමාණයක් මාසික වැටුපෙන් ගෙවිය යුතු අතර, සංස්ථාව විසින් ඒ සඳහා 15% ක දායකත්වයක් දරනු ලබයි.
- ❖ ඊට අමතරව සංස්ථාව විසින්, 3% ප්‍රමාණයකින් සේවක භාර අරමුදලට ද දායකත්වය ලබාදෙනු ඇත.
- ❖ 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනත හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ.
- ❖ අනෙකුත් ආන්තික ප්‍රතිලාභ.

**පොදු කොන්දේසි**

- ❖ නිර්දේශිත ආකෘතිවලම සකස් කළ අයදුම්පත් ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා ඇමතුම් අංක සමග ඉදිරිපත් කළ යුතුය. සියලුම අධ්‍යාපනික සහතිකවල සහතික කළ පිටපත් අයදුම්පතට අමුණා තිබිය යුතුය. අදල අයදුම්පත රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිල වෙබ් අඩවිය වන **http://www.spmclanka.lk** වෙතින් බාගත කළ හැක.
- ❖ රජයේ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයන්ගේ අයදුම්පත්, අදල ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමුකළ යුතු අතර, ඔහු විසින් අදල අයදුම්කරු මෙම තනතුරුවලට තෝරාගතහොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිද යන්න සඳහන් කළ යුතුය.
- ❖ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු අතර, පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන්, මෙම දැන්වීම පළවී දින 10 ක් ඇතුළත ලැබීමට සැලැස්විය යුතුය.
- ❖ ඉහත අවශ්‍යතා සපුරාලනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**සභාපති, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව,**
**අංක 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත,**
**කඳවල වත්ත, රත්මලාන.**